සැ. යු .– මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටස් ජූරි සභික නාමාවලියක් පළ වේ.
2010.01.01 දින පළවූ අංක 1635 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,636 - 2010 ජනවාරි මස 08 වැනි සිකුරාදා - 2010.01.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 46 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 49 |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජනවාරි මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජනවාරි මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

එක්සත් රාජධානිය එංගලන්තය N13, 4BS ග්‍රීන් ලේන්, අංක 483 හි පදිංචි (අංක 094328517 දරන බ්‍රිතාන්‍ය ගමන් බලපත්‍රය හිමි) කිම් ලින්ඩා ජෝන් කුලින් යන මා විසින් මඩිහ, පුබුදු මාවත ද රීෆ් හවුස් හි පදිංචි (අංක 039887308 දරන බ්‍රිතාන්‍ය ගමන් බලපත්‍රය හිමි) ඉවාන් මැල්කම් ටේලර් වෙත ප්‍රදානය කරන ලද ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් සහ නීතිඥ බින්දු වික්‍රමසේකර යන අය විසින් ලියා සහතික කරන ලද 2009 අගෝස්තු 09 දාතම හා අංක 535 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් බලරහිත කොට, ශූන්‍ය කොට අවලංගු කරනු ලබන බවත් හා මා වෙනුවෙන් ඔහු විසින් එළඹෙනු ලබන කුමන හෝ ගනුදෙනුවක් සඳහාවත් මා වගකියනු නොලබන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් සහ එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

කිම් ලින්ඩා ජෝන් කුලින්.

අංක 483, ග්‍රීන් ලේන්,
ලන්ඩන් N13, 4BS,
එක්සත් රාජධානිය.

01-286

---

## මහජනයා වෙත කෙරෙන දැනුම් දීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි ලියාපදිංචි කරන ලද සීමිත වගකීම් සහිත සමාගමක් වන ලියාපදිංචි අංක පීබී 300 දරන කොළඹ 01 ජනාධිපති මාවතේ අංක 69 දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති SMB කෙනන්ගා ඉන්වෙස්ට්මන්ට් කෝපරේෂන් ලිමිටඩ් ආයතනය එහි වර්තමාන ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 100,000,070 සිට 25,000,070 දක්වා අඩු කිරීම සුදුසු බව එකී ශ්‍රී ලංකා ජනරජයේ මහජනයා වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ. මෙය ආයතනයේ අතිවිශේෂ මහ සභා රැස්වීමක් මෙම දිනයේ සිට දින 60 කට නොඅඩු දිනයක දී කැඳවීමෙන් සිදුකිරීමට ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ කර ඇත. ඒ අනුව අදාළ ප්‍රකාශිත ප්‍රාග්ධනය අඩු කිරීම සහ ඊට අදාළ මෙම නිවේදනය 2007 අංක 7 දරන සමාගම් පනතේ 59 වගන්තිය ප්‍රකාරව දක්වා ඇත.

යෝජිත ප්‍රකාශිත ප්‍රාග්ධනය අඩුකිරීම අතිවිශේෂ මහ සභා රැස්වීමේ දී කොටස්කරුවන් අනුමත කිරීමෙන් අනතුරුව ආයතනයේ නව ප්‍රකාශිත ප්‍රාග්ධනය රු. 25,000,070 වන අතර එය සාමාන්‍ය කොටස් 10,000,007 කින් යුක්ත වනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි.

ඉන්ටර්නැෂනල් කොන්සල්ටන්සි ඇන්ඩ්
කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ආයතනයේ ලේකම්වරු.

2009 දෙසැම්බර් මස 18 වැනි දින.
35/1. ඩික්මන් පාර,
කොළඹ 05.

01-285

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

බද්දේගම, බද්දේගම උතුර, "දිල්හානි" හි පදිංචි, අරඹේගොඩ, ලොකුගමගේ තුෂාර ගුණසේකර වන මම, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුල්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥාපනතේ (107 අධිකාරයේ) 7 වැනි වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, සියලුම මහජනතාවටත්, මෙයින් දන්වා සිටිමි.

ඒ. එල්. ජී. ටී. ගුණසේකර.

2009 ක්වූ දෙසැම්බර් මස 21 වැනි දින.
"දිල්හානි",
බද්දේගම උතුර,
බද්දේගම.

01-238

---

## 2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කෙරෙන නිවේදනයයි

සනෙක් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2009 නොවැම්බර් මස 23 වැනි දින ලියාපදිංචි අංක පීවී 70081 යටතේ සංස්ථාපිතයි.

ලියාපදිංචි ලිපිනය : නො. 548/ඒ, හයිලෙවල් පාර, ගොඩගම, හෝමාගම.

මැග්නි කන්සල්ටන්ස් ප්‍රයිවට් ලිමිටඩ්.
ලේකම්.

01-295

---

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය ප්‍රකාර සී/ස. A. D. N. ප්ලාන්ටේෂන් (පුද්ගලික) සමාගම, සිය සමාගම් නාමය 2009 නොවැම්බර් 16 දා සිට සී/ස. A. P. N. ප්ලාන්ටේෂන් (පුද්ගලික) සමාගම යනුවෙන් වෙනස්කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගම් අංකය : පී.වී. 63368
සමාගම ලියාපදිංචි කාර්යාලය : 195/1එෆ්, කොස්ගහවත්ත මාවත,
මාලපල්ල, පන්නිපිටිය.

සී/ස. A. P. N. ප්ලාන්ටේෂන් (පුද්ගලික) සමාගම,
අධ්‍යක්ෂ මණ්ඩලය.

01-248

### නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

උයන්වත්ත, අඹතැන්න අංක 1/19 පදිංචි කුලතුංග මුදියන්සේලාගේ රංජිත් කුලතුංග වන මම, මහනුවර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා 107 අධිකාරය වන නොතාරිස් ආඥාපනතේ 7 වැනි වගන්තිය ප්‍රකාර මෙතැන් සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

කේ. ඇම්. ආර්. කුලතුංග.

අංක 1/19, උයන්වත්ත,
අඹතැන්න.

01-241

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

අළුත්ගම, කළුවාමෝදර, වඩුමුල්ල පාර, අංක 56 දරන ස්ථානයේ පදිංචි, සිංහාර සුදන්තා ප්‍රේමලාල් සිල්වා වන මම, කළුතර දිස්ත්‍රික්කයේ අළුත්ගම පදිංචි අම්බලන්ගොඩගේ ගාමිණී ගුණවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් මහතා විසින් වර්ෂ 2004.02.14 වැනි දින ලියා සහතික කරන ලද අංක 1377 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් අළුත්ගම, කළුවාමෝදර, ශ්‍රී සීලානන්ද පාරේ පදිංචි සිංහාර සුනිල් ධර්මරත්න යන අය වෙත පවරන ලද එකී ඇටෝර්නි බලය වර්ෂ 2009 ක්වූ දෙසැම්බර් මස 21 දින සිට බලපැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, ශ්‍රී ලංකාවාසී සියලු දෙනාටමත් මෙයින් දැනුම් දෙමි.

සිංහාර සුදන්තා ප්‍රේමලාල් සිල්වා.

2009 දෙසැම්බර් මස 21 වැනි දින.

01-354

---

### නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

වැලිවේරිය ඇටිකෙහෙල්ගල්ල අංක 176/3 යන ස්ථානයේ පදිංචි මාබිම හේවගේ හේමාල් වීරසිංහ වන මම, ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥාපනතේ (107 වැනි අධිකාරය) 7 වැනි වගන්තියේ ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, සියලුම මහජනයාටත් මෙයින් දන්වා සිටිමි.

එම්. එච්. එච්. වීරසිංහ.

2009 ක්වූ දෙසැම්බර් මස 22 වැනි දින දීය.

01-313

---

### නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

වාද්දුව, මහා විහාර පාර, අංක 241 හි පදිංචි පැටිකිරි ආරච්චිල්ලාගේ ජයසිංහ වන මම, කළුතර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා 107 අධිකාරය වන නොතාරිස් ආඥාපනතේ 7 වගන්තිය ප්‍රකාර මෙතැන් සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව මෙයින් සියලු දෙනා වෙත දන්වා සිටිමි.

පී. ඒ. ජයසිංහ.

241, මහා විහාර පාර,
වාද්දුව.

01-350

---

### වගකීම් සීමාසහිත සමාගමක් පිහිටුවීම සඳහා වූ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ අංක 9(1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : අර්වින් වර්ණසූරිය ඇන්ඩ් ආර්. ඒ. ප්‍රනාන්දු හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 69119
ලියාපදිංචි කාර්යාලය : අංක 105/1, 1/1, දුටුගැමුණු වීදිය, කොහුවල.

සමාගම් ලේකම්.

01-283

---

### වගකීම් සීමාසහිත සමාගමක් පිහිටුවීම සඳහා වූ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ අංක 9(1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : බී. ඒ. බිස්නස් ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 60687
ලියාපදිංචි කාර්යාලය : අංක 94, ඉදිරිස් මවුලාන පාර, අක්කරපත්තු -1

සමාගම් ලේකම්.

01-282

---

### විශේෂ ඇටෝර්නි බලය අවලංගු කිරීම

හාරිස්පත්තුව, මැදවල, පැනහැටිපොල, නො. 265 හි පදිංචි හේරත් මුදියන්සේලාගේ අබේරත්න බණ්ඩා වන මා විසින් එම ලිපිනයෙහිම පදිංචි පද්මා කුමාරි සමරකෝන් යන අයට 2007.11.12 වැනි දින වත්සලා

කුමාරි හේරත් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 816 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කොට බලරහිත කරන ලබ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවටත්, පොදු මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

එච්. එම්. අබේරත්න බණ්ඩා.

2009 දෙසැම්බර් මස 24වැනි දින.

01-367

---

## දැන්වීමයි

මාතර, 55/2, කුමාරදාස මාවත, පදිංචි ගුණසේන පතිරණගේ සමරසිංහ වන මම, මාතර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත්වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා 107 අධිකාරියේ නොතාරිස් ආඥාපනතේ 7 වැනි වගන්තිය ප්‍රකාර මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව මෙයින් දන්වා සිටිමි.

ජී. පී. සමරසිංහ.

2009 ක්වූ දෙසැම්බර් මස 23 වැනි දින,
මාතර.

01-329

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

### වින්ක් ඇඩ්වර්ටයිසින් (ප්‍රයිවට්) ලිමිටඩ්

### 2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 334(2) වගන්තිය යටතේ පවත්වනු ලබන ණය හිමියන්ගේ රැස්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 334(2) වැනි වගන්තිය යටතේ වින්ක් ඇඩ්වර්ටයිසින් (ප්‍රයිවට්) ලිමිටඩ් හි (මින් පසු සමාගම යනුවෙන් හඳුන්වනු ලබන) සමාගම් පනතේ 334(3) (ආ) වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ණය හිමියන්ගේ රැස්වීමක් වර්ෂ 2010 ක්වූ ජනවාරි මස 22 වැනි දින පෙ. ව. 10.15 ට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පත්කරනු ලබන ක්ලීටස් මල්ලවාරච්චි මහතාගේ සභාපතිත්වයෙන් යුතුව, අංක 110, නොරිස් කැනල් මාවත, කොළඹ 10, යන ස්ථානයේ පිහිටි ඩිස්ටිලරීස් කොම්පැණි ඔෆ් ශ්‍රී ලංකා (පී. එල්. සී) අධ්‍යක්ෂ මණ්ඩල කාර්යාලයේ දී පහත අරමුණු සඳහා පැවැත්වේ.

#### න්‍යාය පත්‍රය

1. සමාගමේ කටයුතුවල වර්තමාන තත්වය, සමාගමේ ණය හිමියන්ගේ නාම ලේඛනය සහ ඔවුන්ගේ හිමිකම්පෑම් පිළිබඳ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සකසනු ලබන වර්තාවක් ඉදිරිපත් කිරීමට.
2. 2007 අංක 7 දරන සමාගම් පනතේ 335 වැනි වගන්තිය යටතේ සමාගමේ ගණන් බේරා වසා දැමීම සහ වත්කම් බෙදාහැරීම සඳහා ඇවරකරුවකු/ඇවරකරුවන් පත් කිරීම.
3. 2007 අංක 7 දරන සමාගම් පනතේ 336 වැනි වගන්තිය සහ අනෙකුත් ප්‍රතිපාදන යටතේ ගණන් බේරා වසා දැමීමේ කාර්යය සඳහා සුදුසු යැයි සලකණු ලබන්නේ නම්, පස් දෙනෙකුට නොවැඩි ගණනකින් යුත් පරීක්ෂණ කමිටුවක් පත් කිරීමට.
4. 2007 අංක 7 දරන සමාගම් පනතේ 337(1) වැනි වගන්තිය යටතේ ඇවරකරුගේ පාරිශ්‍රමිකය තීරණය කිරීම සඳහා (ඉහත දක්වන ලද පරීක්ෂණ කමිටුව පත්කරනු නොලැබුවහොත් පමණක්)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ෆිනෑන්ෂල් සර්විසස් ඇන්ඩ් කොමර්ෂල්
ඒජන්සීස් ප්‍රයිවට් ලිමිටඩ්.
(වින්ක් ඇඩ්වර්ටයිසින් (ප්‍රයිවට්) ලිමිටඩ් හි
සමාගම් ලේකම්වරු)

**සටහන.-** ණය හිමියා යන්නට (ණයකර හිමියකුද ඇතුළත්ව) සමාගම් පනතේ 138(1)(b) වගන්තිය යටතේ ණය හිමියන්ගේ රැස්වීමකට සහභාගිවීමට සහ ඡන්දය දීමට අයිතිය ඇති අයකු සහ තවද ණය හිමියා සමාගමක් වන විටදී ඒ සමාගම නියෝජනය කිරීම සඳහා ඒ සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ සම්මත කරන ලද යෝජනා සම්මතයක් මගින් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ හෝ ඒ යටතේ පනවනු ලැබූ වෙනත් නීතියක් යටතේ හෝ ණයකර පත්‍රිකාවක හෝ බාර ඔප්පුවක ප්‍රතිපාදනයක් යටත් පවත්වනු ලබන ණය හිමියන්ගේ රැස්වීමකට සහභාගිවීමට බලය ලද පුද්ගලයකුට ඇතුළත් වේ.

01-373

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ජනරජයේ අතුරුගිරිය, ඔරුවල අබේතිස්ස මාවත අංක 183/ඩී දරන නිවසේ පදිංචි අබේසිරි නාරායන දිල්රුක්ෂි වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් එම්. එල්. සිරන්ත විසින් සහතික කරන ලද වර්ෂ 2008 ක් වූ ජනවාරි මස 10 වැනි දිනැති අංක 2323 දරන ඇටෝර්නි බලයෙන් අතුරුගිරිය, පත්තිනියාවත්ත, 114/ජී දරන නිවසේ පදිංචි පාඩිකංකානමලාගේ රෝහිත නීල් වීරසූරිය වෙත ප්‍රදානය කරන්නට යෙදුණු ඇටෝර්නි බලය මා විසින් 2009 ක් වූ දෙසැම්බර් මස 15 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි මෙයින් අවලංගු කොට ඇති බවත් එකී පාඩිකංකානමලාගේ රෝහිත නීල් වීරසූරිය විසින් මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් කරන්නට යෙදුණු කිසිදු ක්‍රියාවක් හෝ ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් මා මින් මතු වග නොකියන බවත් මහජනතාවට මෙයින් දන්වා සිටිමි.

අබේසිරි නාරායන මංගලා දිල්රුක්ෂි.

2009 ක් වූ දෙසැම්බර් මස 15 වැනි දින දී ය.

01-297

---

## විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 00300 බගතලේ පාර අංක 14 හි පදිංචි ධිරන් ජයිකිෂාන් නිර්මලලිංගම් (ජාතික හැඳුනුම්පත් අංක 670013910 V ) යන අයව මාගේ ඇටෝර්නි බලකරු ලෙස බලකරනු ලැබූ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සන්ජේ තවනේසන් විසින් වර්ෂ 2009 ක් වූ ජූලි මස 20 දින ලියා සහතික

කරන ලද අංක 771 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙතැන් පටන් ශුන්‍ය හා බලරහිත හා නීතිය ඉදිරියේ බලාත්මක කළ නොහැකි ලේඛනයක් බවත් කොළඹ 00700 බාන්ස් පෙදෙස අංක 79 හි පදිංචි සරෝජිනී රත්නරාජ් නවරත්නම් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා මහජනයාට මෙයින් දැනුම් දෙමි.

සරෝජිනී රත්නරාජ් නවරත්නම්.

වර්ෂ 2009 ක් වූ දෙසැම්බර් මස 16 වැනි දින දී ය.

01-300

---

### විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

දික්වැල්ල, මහවීදිය, අංක 48 (දැනට, 109-5235, Finch Avenue East, Scarborough, ontario, MIS 5x3, Canada) පදිංචි උපාලි ගුණරත්න වන මා විසින් මාතර ප්‍රසිද්ධ නොතාරිස් උපාලි සරත්චන්ද්‍ර මහතා ලවා අංක 11766 සහ 2007.06.15 දින දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් එකී බලපත්‍රයේ සඳහන් කාර්යයන් ඇටෝර්නි අධිපති වන මා නමින් සහ මා වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම පිණිස මාගේ ඇටෝර්නි බලකරු හැටියට දෙවිනුවර, ග්‍රාමීය රෝහල පාර "දයාවාස" හි පදිංචි ගාර්දිය වර්ණකුල සමිතපාල යන අයට දෙන ලද බලය මෙයින් අවලංගු කරන අතර, එකී ගාර්දිය වර්ණකුල සමිතපාල යන අය විසින් මා නමින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් මින් ඉදිරියට මා වග නොකියන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන සියලු දෙනාටත් මෙයින් දැනුම් දෙමි.

01-247

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### සෙලාන් බැංකුව පී.එල්.සී. - අත්තිඩිය ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මෙම දේපළ ගල්කිස්ස පදිංචි මදසාමි ජීවරත්නම් යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කෙසෙල්වත්ත පිහිටි කළුතර කොට්ඨාසයේ මිනුම්පති වෙනුවට මිනුම් අධිකාරී ජේ. පී. එන්. එම්. ද සිල්වා විසින් සාදන ලද 1989.10.20 දිනැති අංක 2434 දරන බෙදුම් සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 85 ලකුණු කළ (මූලික සැලසුම් අංක 1387 හි අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් තිස් හයයි දශම හතයි හයක් (අ.0, රූ.0, පර්. 36.76) නොහොත් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි නවයයි තුනක් (හෙක්ටයාර 0.093) ක් විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2010 ජනවාරි මස 26 වැනි දින පෙරවරු 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණු ලැබේ.

*දේපළට පිවිසීම*.- පානදුර, කෙසෙල්වත්ත මංසන්ධියේ සිට දිග්ගල ජැටිය පාරේ කි. මී. 2 ක් පමණ ගිය විට වම්පසට ඇති මහකින්ගම ආදර්ශ ගම්මානයට යන පාරට හැරී තවත් මීටර් 200 ක් පමණ ඉදිරියට ගිය විට පාරේ වම්පස පිහිටා ඇති ප්‍රජාශාලාව මැදින් ඇති පාරේ මීටර් 50 ක් පමණ ගිය විට පාරේ වම්පස අදාළ දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම*.- *රජයේ ගැසට් පත්‍රයේ* 2009.10.30 වැනි දින පළවී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2009.10.19 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2009.10.21 වැනි දින පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- සාර්ථක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැනුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැනුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පී.එල්.සී. වෙත ගෙවා නිමකළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක : 011 2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න *(සාම විනිසුරු)*,
බලයලත් වෙන්දේසිකරු සහ
උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ්. එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත,
කොලොන්නාව.
දු. ක. 011-3068185, 011-2572940.

01-317

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ/05/5841/කේවයි3/958.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.10.16 *ගැසට් පත්‍රයේ* සහ 2009.11.16 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබූවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කටුගස්තොට, කහල්ල, අංක 26බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010.02.15 වැනි දින පස්වරු 1.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

මාතලේ දිස්ත්‍රික්කයේ, මැදසිය පත්තුවේ උකුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ තවලංකොය පිහිටි ෆයිරෝස්හිල්වත්ත (බංගලාව කොටස) ඉඩමට 2003.03.28 දින බලයලත් මිනින්දෝරු ඩබ්. එම්. පී. ජී. ගුණතිලක විසින් බෙදා වෙන්කර සකසන ලද අංක 1239 මිනුම් පිඹුරට අනුව කැබලි අංක 01 ලෙස සඳහන් (මෙය 1983.10.18 දින අංක 1944 මිනුම් පිඹුරට අනුව බලයලත් මිනින්දෝරු කේ. එස්. සමරසිංහ විසින් නැවත බෙදා වෙන් කර සකසන ලද කැබලි අංක 1 බිම් කොටස) ප්‍රමාණයෙන් අක්.0 රූඩ්.0 පර්. 0ක් වූ බිම් කොටස.

මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී 534/189 යටතේ ලියාපදිංචි කොට ඇත.

අයි. විමලසේන,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2009 දෙසැම්බර් මස 24 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-375/1

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ/17/4774/කේවයි3/654.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.08.26 *ගැසට් පත්‍රයේ* සහ 2005.10.10 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබූවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කටුගස්තොට, කහල්ල, අංක 26බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010.02.10 වැනි දින පස්වරු 1.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැකිරාව ප්‍රාදේශීය සභා සීමාවේ, පලුගස්වැව පිහිටි ගොඩඉඩම නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. දසනායක විසින් සකසන ලද 2000.08.14 දිනැති හා අංක 4931 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන අක්. 0, රූඩ්.3, පර්. 5 ක්වූ බෙදා වෙන්කරන ලද බිම් කොටස හා ඊට අයිති සියලු දේත් සමඟ වේ.

මෙය අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්පත් අංක එල්. ඩී. ඕ. 207/205 යටතේ ලියාපදිංචි කොට ඇත.

අයි. විමලසේන,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2009 දෙසැම්බර් මස 24 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-375/8

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ/05/4862/කේඑන්1/242.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.08.26 *ගැසට් පත්‍රයේ* සහ 2005.10.11 දිණමිණ පත්‍රයේ පළ කරනු ලැබූවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කටුගස්තොට, කහල්ල, අංක 26බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010.02.15 වැනි දින පෙරවරු 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

මාතලේ දිස්ත්‍රික්කයේ අඹන්ගඟ කෝරලේ ප්‍රාදේශීය සභා සීමාවත් තුළ ගම්මඩුව, කලුගල්තැන්නහි පිහිටි කලුගල්තැන්න නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. එම්. ජයසේකර විසින් සැකසුණු 2000.10.21 දින හා අංක 9575 දරන පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් අක්. 0, රූඩ්. 2, පර්. 17 ක් වූ බෙදා වෙන්කරන ලද බිම් කොටස හා ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියලුම දේත් සමඟ වේ.

මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 226/138 යටතේ ලියාපදිංචි කොට ඇත.

අයි. විමලසේන,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2009 දෙසැම්බර් මස 24 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-375/7

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

#### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 06ජ්/25163/වයි6/886.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006.10.20 *ගැසට් පත්‍රයේ* සහ 2006.12.18 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබූවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පානදුර ඩයස් ගොඩනැගිල්ල හි බලයලත් වෙන්දේසිකාර එච්. ජී. පෙරේරා මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010.02.20 වැනි දින පෙරවරු 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ බටුවිට පිහිටි මහවිතානගෙවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඒ. සේනානායක විසින් සකසන ලද 1987 ජුනි මස 13, 19 සහ 20 දින සහ අංක 295 දරන පිඹුරේ කැබලි අංක 08 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ.0 රූ.0 පර්.30.2 ක්වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

තව ද එකී දේපළ දැනට ඩී. එච්. ඇතුලත්මුදලි මිනින්දෝරුතැනගේ 1993.07.23 වෙනි දින හා අංක 2714/ඒ දරන පිඹුරේ දක්වා ඇත.

මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක සී 111/194 යටතේ ලියාපදිංචි කොට ඇත.

අයි. විමලසේන,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2009 දෙසැම්බර් මස 24 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-375/9

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

#### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 06/40896/එල්6/910.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.01.16 *ගැසට් පත්‍රයේ* සහ 2004.10.02 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබූවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පානදුර ඩයස් ගොඩනැගිල්ල හි බලයලත් වෙන්දේසිකාර එච්. ජී. පෙරේරා මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010.02.20 වැනි දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ කැකුලන්දොල පිහිටි පිඹුරවත්ත (ස්වර්ණරේඛාගම) නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. කේ. මහින්ද විසින් 1997.12.26 දින සකසන ලද අංක 260 දරන පිඹුරේ කැබලි අංක 95 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අ.0, රූ.0, පර්.19.93 ක්වූ බිම් කොටස වේ.

තව ද පිඹුරු අංක 260 මතින් දක්වා ඇති මාර්ග අයිතිය ද සමග වේ.

මෙය මතුගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ 292/10 යටතේ ලියාපදිංචි කොට ඇත.

අයි. විමලසේන,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2009 දෙසැම්බර් මස 14 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-375/10

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 01/42999/සීඩී6/821.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.05.13 *ගැසට් පත්‍රයේ* සහ 2005.07.05 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010.02.18 වැනි දින පස්වරු 1.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ කොරතොට ගමේ මිල්ලගහවත්ත දැන් ඉසුරුසිරි උයන නමින් හඳුන්වන ඉඩමේ 1993.09.18 සහ 23 දින බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. පෙරේරා විසින් සකසන ලද සහ 2001.07.17 දින සංශෝධනය කරන ලද 1253 දරන පිඹුරේ කැබලි අංක 22 ලෙසින් බෙදා වෙන් කරන ලද ප්‍රමාණයෙන් අ.0, රූ.0, පර්.10 ක්වූ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුදේත් සමග වේ.

තව ද එකී 1253 දරන පිඹුරේ කැබලි අංක 13, 44, 45 සහ 46 මතින් වූ මාර්ග අයිතියද වේ.

මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ජී 1069/105 යටතේ ලියාපදිංචි කොට ඇත.

අයි. විමලසේන,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2009 දෙසැම්බර් මස 24 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-374

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීමයි.

ණය අංකය :- කේ/05/5546/කේවයි3/821.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.07.15 *ගැසට් පත්‍රයේ* සහ 2005.08.22 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කටුගස්තොට, කහල්ල, අංක 26බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010.02.15 වැනි දින පස්වරු 3.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල ප්‍රාදේශීය සභා සීමාවේ උඩතැන්න පිහිටි උඩතැන්නවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඕ. පෙරේරා විසින් සැකසුණු 2002.09.12 දින හා අංක 2083 දරන පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් අක්. 0, රූඩ්. 0, පර්. 19.2 ක් වූ බෙදා වෙන්කරන ලද බිම් කොටස හා ඒ මත පිහිටි සියලුම දේත් සමඟ වේ.

තව ද ඉහත අංක 2083 පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වා ඇති බිම් කොටස කේ. ඕ. පෙරේරා මිනින්දෝරුතැනගේ 1997.06.01 දිනැති හා අංක 1148 දරන පිඹුරේ කැබලි අංක 5 හි නැවත මිනුමක් වන අතර ප්‍රමාණයෙන් අක්. 0, රූඩ්. 0, පර්. 19.2 කි.

තව ද එකී අංක 1148 දරන පිඹුරේ කැබලි අංක 07 මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

මෙය මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී 460/270, 271 යටතේ ලියාපදිංචි කොට ඇත.

අයි. විමලසේන,
*වැඩ බලන සාමාන්‍යාධිකාරී.*

2009 දෙසැම්බර් මස 24 වැනි දින.
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-375/6

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ/5/3451/ඩී5/746, 5/76043/කේවයි3/118

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.01.16 *ගැසට් පත්‍රයේ* සහ 2009.03.30 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කටුගස්තොට, කහල්ල, අංක 26බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010.02.16 වැනි දින පස්වරු 02.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ කන්දපල්ල කෝරලයේ මාතලේ උතුර සියඹලාවැව පිහිටි වැලිකඩයාය නමැති ඉඩමට

බලයලත් මිනින්දෝරු එල්. සිරිපාල විසින් මැන සකසන ලද 1998.05.05 වැනි දින අංක 106 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 01, පර්. 28 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස.

මෙම ඉඩම් කොටස මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම් පත් අංක ඩී 385/64 හි ලියාපදිංචි කොට ඇත.

අයි. විමලසේන, (මිය)
*වැඩ බලන සාමාන්‍යාධිකාරි.*

2009 දෙසැම්බර් මස 24 වැනි දින.
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-375/5

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 18/71974/වයි18/929.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.11.11 ගැසට් පත්‍රයේ සහ 2006.01.23 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කටුගස්තොට, කහල්ල, අංක 26බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2010.02.16 වැනි දින පෙරවරු 11.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ උඩුම්ය මොරගොල්ල සහ පාම්බෙ ග්‍රාමයන්හි පිහිටි ක්ලෝවිස් එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. ඩබ්. ඩී. එස්. ගුණරත්න විසින් සකසන ලද 1997.10.30 දිනැති හා අංක 92/97 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 7ඒ ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 01, රූ. 0, පර්. 0 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙම ඉඩම් කොටස කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්පත් අංක එෆ් 1166/128 හි ලියාපදිංචි කොට ඇත.

අයි. විමලසේන, (මිය.)
වැඩ බලන සාමාන්‍යාධිකාරි.

2009 දෙසැම්බර් මස 24 වැනි දින.
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-375/4

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ4/2069/කේවයි2/301.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2000.04.14 *ගැසට් පත්‍රයේ* සහ 2000.08.28 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය මීගමුව, ප්‍රනාන්දු ඇවනිව්, අංක 22හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2010.02.13 වැනි දින පෙරවරු 11.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ අඹගමුව ප්‍රාදේශීය සභා සීමාව තුල අඹගමුව පිහිටි බලයලත් මිනින්දෝරු ටී. අමරපාල විසින් සැකසුණු 1992.02.10 වැනි දින හා අංක 45 දරන පිඹුරේ ඕව්ටගෙදරවත්ත නමැති ඉඩමේ ප්‍රමාණයෙන් අ. 0, රූ. 01, පර්. 35.63 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

මෙම ඉඩම් කොටස ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක බී 36/141 යටතේ ලියාපදිංචි වී ඇත.

අයි. විමලසේන, (මිය.)
*වැඩ බලන සාමාන්‍යාධිකාරි.*

2009 දෙසැම්බර් මස 24 වැනි දින.
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

01-375/2

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරුනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ/13/5516/කේඑන්1/330

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009.01.02 *ගැසට් පත්‍රයේ* සහ 2009.10.05 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොලිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර

ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කටුගස්තොට, කහල්ල, අංක 26බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2010.02.13 වැනි දින පස්වරු 2.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### ඉහත සඳහන් උපලේඛනය

නුවරඑළිය දිස්ත්‍රික්කයේ තිස්පනේ කෝරලේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තිස්පනේ කෝරලේ අංක 462බී ගොඩමඩිත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තිස්පනේ උඩුගම්මැද්ද ග්‍රාමයේ පිහිටි තිස්පනේ වත්ත කටුගොල්ල නමැති ඉඩමේ රජයේ මිනුම්පති විසින් මැන සකසන ලද 1989.10.31 දිනැති හා අංක පිපිනු/1270 දරන මිනුම් පිඹුරේ කැබලි අංක 146 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 1, පර්. 1.10 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස වේ.

මෙම ඉඩම් කොටස නුවරඑළිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම් පත් අංක කො/166/558/2001 හි ලියාපදිංචි කොට ඇත.

තවද එකී මිනුම් පිඹුරේ පිහිටි සියලු මාර්ග අයිතීන් හා ඒ මත ඇති සියලු දේත් සමග වේ.

අයි. විමලසේන (මිය),
වැඩ බලන සාමාන්‍යාධිකාරි.

2009 දෙසැම්බර් මස 24 වැනි දින.
අංක 269, ගාලුපාර,
කොළඹ 03.

01-375/3

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනත 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

මීගමුව, ඒත්තුකාල, අංක 133/1, හි රාණි සමූහ ව්‍යාපාරයේ ණය වගකීම් සඳහා, බස්නාහිර පළාතේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, (දැනට මීගමුව මහ නගර සභා සීමාව තුළ) දූනගහපත්තුවේ, ඒත්තුකාලෙහි පිහිටි මට්ටමක්කුලියේපල්ලම නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එල්. බී. නානායක්කාර විසින් සාදනලද 1990.09.07 දිනැති අංක 9211 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා ඇති උකස් කරන ලද දේපළ.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009 නොවැම්බර් මස 06 දිනැති අංක 1627 දරන ගැසට් පත්‍රයේ හා 2009.10.26 දිනැති දිනමිණ, ඩේලිනිවුස් හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥාපනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගතහැකි මුල් මුදලේ ශේෂයද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියද, ගාස්තු හා මුදල්ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදීම 2010 පෙබරවාරි මස 12 වැනි දින ප. ව. 3.00ට කොළඹ 05, හැව්ලොක් පාර, අංක 290 හි පදිංචි ප්‍රසිද්ධ පුරෝගාමී වරලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### ඉහත සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහනගර සභා සහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ, ඒත්තුකාලෙහි පිහිටි මට්ටක්කුලියේපල්ලම නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එල්. කෲස් දාබරේරා විසින් සාදන ලද 1990.10.27 දිනැති අංක 5573/1990 දරන පිඹුරෙහි ලොට් බී1 ලෙස දක්වා සීමා නිර්නය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට පාර ද, නැගෙනහිරට ඕසීස් බීච් හොටෙල් හි ලොට් බී2ද, දකුණට එන්. ජේ. කුරේගේ ලොට් සී ද, බස්නාහිරට පාර (මහා මාර්ගය) ද, මායිම්ව පර්චස් විසිපහක (අ. 0, රූ. 0, පර්. 25) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ.

එකී බිම් කැබැල්ල පහත විස්තර කර ඇති ඉඩමෙහි නැවත මැනීමකි.

බස්නාහිර පළාතේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, (දැනට මීගමුව මහ නගර සභා සීමාව තුළ) දූනගහපත්තුවේ, ඒත්තුකාලෙහි පිහිටි මට්ටමක්කුලියේපල්ලම නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. ල්. බී. නානායක්කාර විසින් සාදනලද 1990.09.07 දිනැති අංක 9211 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා නිරූපනය කර ඇති බෙදූ කොටස එනම්, එකී ලොට් 1 උතුරට අඩි 10ක් පළල පාරද, නැගෙනහිරට අංක 1631 දරන පිඹුරෙහි ලොට් බී2 ද, දකුණට ලොට් සී ද, බස්නාහිරට පාර - මීගමුවේ සිට කොච්චිකඩේ දක්වා මහා මාර්ගය ද, මායිම්ව පර්චස් විසිහතරයි දශම හතරක (අ. 0, රූ. 0, පර්. 24.4) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර, පෝරුතොට පාරේ, වරිපනම් අංක 116 සහ 116/1 දරන එහි ඇති ගොඩනැගිලි, වගාවන් සහ සියලු දේද වේ.

ඒ සමගම මෙයට උතුරු දෙසට ඇති අඩි 10ක් පළල පාර භාවිතා කිරීමට අයිතියද ඇති අතර, මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 690/275හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එම්. තිලකරත්න බණ්ඩා,
ප්‍රධාන කළමනාකරු.
(අයකරගැනීම් - ආයතනික)

ලංකා බැංකුව,
අයකරගැනීමේ ඒකකය.
අංක 4, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

01-361

---

## ඩී. එෆ්. සී. සී. වර්ධන බැංකුව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීමයි.

(1) වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම ප්‍රාදේශීය සභා සීමාව තුළ වැඋඩ විල්ලි හත්පත්තුවේ, ගන් දහය කෝරලේ මාවතගම, මිතැන්වල, පල්ලේගම, රඹත්ත සහ ඔලියමුල්ල යන ගම්වල පිහිටි සීපිල්ඩ් යන ඉඩමේ බලයලත් මානක ඩබ්ලිව්. ඩී. බී. රෙජිනෝල්ඩ් විසින් 1969 ජූලි මස 05 වැනි දින සාදන ලද අංක 1410 දරන පිඹුරේ ලොට් 9 දරන ඉඩම් නැවත මැනීමකට අනුව අංක 2004/59 හා 2004 මාර්තු 08 දිනැති පිඹුර ප්‍රකාර කැබලි අංක 01 දරන ඉඩම් කොටසේ ප්‍රමාණය පර්චස් විසිහතරක් (අ. 0, රූ. 0, ප. 24) හෝ හෙක්ටයාර් (0.0607) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොල, වගාවන් සහ සියලුදේත් සමග.

(2) වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාවතගම ප්‍රාදේශීය සභා සීමාව තුළ වැඋඩවිල්ලි හත් පත්තුවේ, ගන්දහය කෝරළේ, මදව, උඩුමුල්ල, පිලැස්ස සහ හේනපොල යන ග්‍රාමයන්හි පිහිටි ඩේසිමවුන්ට් එස්ටේට් කියන ඉඩමේ බලයලත් මානක ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් 1997 ඔක්තෝබර් මස සාදන ලද අංක 171/97 දරන පිඹුරේ බෙදා වෙන්කරන ලද ලොට් 33 දරන කොටසේ ප්‍රමාණය (අ. 0, රූ. 0, ප. 15) හෝ (හෙක්ටයාර් 0.0379), විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොල, වගාවන් සහ සියලු දේත් සමඟ වේ.

(3) ඉහත කී මදව, උඩුමුල්ල, පිලැස්ස සහ හේනපොල යන ගම්වල පිහිටි ඩේසි මවුන්ට් එස්ටේට් කියන ඉඩමේ බලයලත් මානක ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් සාදන ලද අංක 171/97 හා 1997 ඔක්තෝබර් දරන පිඹුර පරිදි බෙදා වෙන්කරන ලද ලොට් 34 දරන බිම් කට්ටියේ ප්‍රමාණය (අ. 0, රූ. 0, ප. 15) හෝ (0.0379 හෙක්ටයාර්) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොල, වගාවන් සහ සියලුදේත් සමඟ වේ.

(4) ඉහත කී මදව, උඩුමුල්ල, පිලැස්ස සහ හේනපොල යන ගම්වල පිහිටි ඩෙසි මවුන්ට් එස්ටේට් කියන ඉඩමේ බලයලත් මානක ඩබ්ලිව්. සී. එස්. එම්. අබේසේකර විසින් 1997 ඔක්තෝබර් මස සාදන ලද අංක 171/97 දරන පිඹුර පරිදි බෙදා වෙන්කරන ලද ලොට් 36 දරන බිම් කට්ටියේ ප්‍රමාණය (අ. 0, රූ. 0, ප. 12) හෝ (හෙක්ටයාර් 0.0304) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොල, වගාවන් සහ සියලුදේත් සමඟ වේ. කියෝඩෝ ලංකා එන්ටර්ප්‍රයිසස් යන නාමය, අභිධානය සහ ආයතනය යටතේ නුගේගොඩ හවුල් වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන අකුරන්ගේ ලයනල් ජයසිංහ සහ දේවිකා මල්කාන්ති රන්කොත්ගෙදර (විවාහයට පෙර ජයසිංහ) යන අය විසින් ණයකරුවන් හැටියටද, ඩී. එෆ්. සී. සී. වර්ධන බැංකුවට උකස් කරන ලද පහත විස්තර කරන ලද දේපළ ලොට් 1 දරන ඉඩම (අ. 0, රූ. 0, ප. 24) (හෙක්ටයාර් 0.0607) 2010 පෙබරවාරි මස 01 වැනි දින පෙ. ව. 11.00 ට ද, ලොට් 33 දරන ඉඩම (අ. 0, රූ. 0, ප. 15) (හෙක්ටයාර් 0.0379), ලොට් 34 දරන ඉඩම (අ. 0, රූ. 0, ප. 15) (හෙක්ටයාර් 0.0379), ලොට් 36 දරන ඉඩම (අ. 0, රූ. 0, ප. 12) (හෙක්ටයාර් 0.0304) ලොට් 33, 34,36 දරන ඉඩම් 2010 පෙබරවාරි මස 01 වැනි දින ප. ව. 12.30ටද, මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය :* වෙන්දේසිකරු විසින් වෙන්දේසිය නතරකළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේම මුදලින් ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%)
2. පළාත්සභා ගාස්තුව සියයට එකක් (01%)
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැනුම් මිලෙන් සියයට (2 1/2%)
4. නොතාරිස් ගාස්තුව රු. 2,000
5. ලිපිකරු හා සෝෂක ගෙවීම් රු. 500
6. ප්‍රචාරක වියදම් සඳහා වැයකරන ලද මුළු මුදල
7. ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) ශ්‍රී ලංකා ජනරජයේ හෝ වෙනත් නිලධාරින් විසින් නියෝග කරන ලද පරිදි ජී. එස්. ටී. 12.5% සමඟ ව්‍යවස්ථාපිත බද්ද, රාජකාරි බදු සහ වෙනත් ගෙවීම් නිකුත්කළ දින සිට දින 30ක් තුළදී ගෙවිය යුතුයි.

වැඩි විස්තර සඳහා ඩී. එෆ්. සී. සී. වර්ධන බැංකුවේ, 2371371 ට අමතන්න.

එල්. බී. සේනානායක - *සාම විනිසුරු,*
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්.

අංක 99, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන/ෆැක්ස් : 011-2445393

01-351

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.- නාරම්මල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බලයලත් මානක එම්. ගුණසේකර විසින් 1998 අගෝස්තු මස 09 වැනි දින සාදන ලද අංක 1805 දරන පිඹුර පරිදි වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙනි හත්පත්තුවේ, උඩුකහ උතුර කෝරළේ, ලිනියාවත්ත පිහිටි ගල්වත්ගියවත්ත කියන බෙදා වෙන්කරන ලද ලොට් 1 දරන රූඩ් එකයි පර්චස් හයයි දශම දෙක (අ.0, රූ.1, පර්. 6.2) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සියලුදේත් සමග වේ.

ජයකොඩි ආරච්චිගේ මහින්ද බන්දුල ජයකොඩි ණයකරු හැටියටද, ඔහු විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් (දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමින් හඳුන්වන) ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ වර්ෂ 2010 ක්වූ ජනවාරි මස 27 වැනි දින පෙ. ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2008.06.20 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද,* සහ ද අයිලන්ඩ්, ලක්බිම, සහ තිනකරන් පත්‍ර බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2010.01.08 වැනි දින *රජයේ ගැසට්* පත්‍රයද, 2010.01.11 දිවයින සහ ද අයිලන්ඩ් පත්‍ර බලන්න.

*ඉඩමට පිවිසීම.-* නාරම්මල නගරයේ සිට කුලියාපිටිය පාරේ කි. මී. 2 ක් පමණ ගල්වංගුව මංසන්දිය දක්වා ගියවිට එකී දේපළවලට ලඟාවිය හැක. එම දේපළ එම පාර කෙළවරෙහි දෘෂ්‍යමාන වේ.

*ගෙවීමේ ක්‍රමය.-* විකිණීම ස්ථිර කළ වහාම ගැනුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය :

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පලාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැනුම් මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
4. නොතාරිස් ගාස්තු රු. 2000,
5. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
6. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැනුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ නාරම්මල ශාඛාවේ තැන්පත් කළ යුතුයි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

අංක : 99,
උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන/ෆැක්ස් : 011-2445393
දුරකථන අංකය : 011-3144520.

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී,
අංක : 55,
මීගමු පාර,
නාරම්මල.
දුරකථන අංකය : 037-2249916-7
ෆැක්ස් : 037-2248550.

01-353

**සම්පත් බැංකුව පීඑල්සී (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

එච්. ටී. දේශප්‍රිය සහ ඒ. ආර්. ලියනගේ
ගිණුම් අංක : 1013 5310 5796

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2007 ක් වූ සැප්තැම්බර් මස 28 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් තිස් එක් ලක්‍ෂ හැට දහස් පන්සිය අනූ එකයි ශත අනූ පහක (රු. 3,160,591.95) මුදලද 2007 ජූනි 19 වැනි දින සිට අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් විසි නම ලක්‍ෂ විසි දහස් හත්සිය හතලිස් එකයි ශත හැට හතරක (රු. 2,920,741.64) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනයි දශම පහක් (13.5%) බැගින් වූ පොලියද, හා ප්‍රචාරණ වියදම්ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තුද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.08.21 දින රජයේ ගැසට් පත්‍රයේ, 2009.08.06 දින දිවයින, අයිලන්ඩ් සහ තිනකුරල් දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2010.02.12 දින ප. ව. 1.30ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාවත් තුළ ගංගොඩවිල පරණ කැස්බෑව පාරෙන් හැරී පිහිටි වර්තමානයේ පරණ කැස්බෑව පාර වරිපනම් අංක 117 දරන ඇලබොඩවත්ත යැයි කියනු ලබන ඉඩමට (බලයලත් මානක තැන එච්. ජී. සී. ඩයස් යන අය විසින් සාදන ලද 1973 දෙසැම්බර් 05 දාතම හා අංක 339 සර්වසම ලොට් ඒ හී නැවත මිනුමක් වන) බලයලත් මානක තැන කේ. ජී. ජී. පියසේන යන අය විසින් සාදන ලද 2006 අප්‍රේල් මස 06 දාතම හා අංක 1345 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට පරණ කැස්බෑව පාර වරිපනම් අංක 115/3, දරන පරිශ්‍රයන්, නැගෙනහිරට කැළණිවැලි දුම්රිය මාර්ගය සහ දුම්රිය මාර්ග වෙන්කිරීම, දකුණට කාණුව සහ පිඹුරු අංක 339 හී ලොට් බී සහ බස්නාහිරට ගංගොඩවිල ඇල යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොලහයි දශම නමයයි හතක් (ඒ. 0, ආර්. 0, පී. 11.97) විශාල ඉඩම් කොටස සමග ගහකොල, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්. පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 1345 ට අනුවය.

පරණ කැස්බෑව පාරේ සිට එකී පිඹුරු අංක 1345 හී එකී ලොට් ඒ දක්වා අඩි 18 පළල පිවිසුම් මාර්ගය මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමගය.

බලයලත් මානක තැන එච්. ජී. සී. ඩයස් යන අය විසින් සාදන ලද 1973 දෙසැම්බර් මස 05 දාතම හා අංක 339 පිඹුරේ සර්වසම ලොට් ඒ හි නැවත මිනුමක් වන ඉහත විස්තර කොට ඇති ලොට් ඒ පහත මැනවින් විස්තර කොට ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ කෝට්ටේ නගර සභා සීමාවත් තුළ ගංගොඩවිල පිහිටි පරණ කැස්බෑව පාර වරිපනම් අංක 115/4 දරන ඇලබොඩවත්ත යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. ජී. සී. ඩයස් යන අය විසින් සාදන ලද 1973 දෙසැම්බර් මස 05 දාතම හා අංක 339 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට විජේරත්න විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට කැළණිවැලි දුම්රිය මාර්ග වෙන්කිරීම, දකුණට දිය පාර සහ බස්නාහිරට පරණ ඇල යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොලහයි දශම තුනයි අටක් (ඒ0, ආර්. 0, පී.11.38) විශාල ඉඩම් කොටස සමග ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ එකී පිඹුරු අංක 339ට අනුව වෙළුම/පත්ඉරුව එම් 277/212හි ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

01-368

---

**සම්පත් බැංකුව පීඑල්සී (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

ගුණවර්ධන කන්ස්ට්‍රක්ෂන්ස්
ගිණුම් අංක : 0056 1000 0233

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2008 ක් වූ අප්‍රේල් මස 30 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හැට එක් ලක්‍ෂ අනූ හත් දහස් හාරසිය පනස් නමයයි ශත හතලිස් නමයක (රු. 6,197,459.49) මුදලද 2007 නොවැම්බර් 03 දින සිට බැඳුම්කර අංක 2513 මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් හත් ලක්‍ෂ එකොලොස් දහස් හාරසිය දහ අටයි ශත තිස් එකක (රු. 5,711,418.31) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනක් (13%) බැගින් වූ පොලියද, හා ප්‍රචාරණ වියදම්ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තුද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.11.20 දින රජයේ ගැසට් පත්‍රයේ, 2009.11.09 දින දිවයින, අයිලන්ඩ් සහ තිනකුරල් දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2010.02.03 දින පෙ. ව. 11.30ට පිහිටි ස්ථානයේදී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ පාත හේවාහැට ගංදහය කෝරලේ තල්වත්ත ග්‍රාමයේ පිහිටි පට්ටියකැලේ එස්ටේට් යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන යූ. එච්. බී. කේ. එම්. ටී. අංගම්මන යන අය විසින් සාදන ලද 2003 සැප්තැම්බර් 25 දාතම හා අංක 1135 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 15 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට ලොට් 13 සහ 23, නැගෙනහිරට ලොට් 16, දකුණට ලොට් 18 සහ බස්නාහිරට ලොට් 14 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොලහක් (අක්. 0, රූඩ්. 0, පර්. 12)

විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග වෙළුම/පත්ඉරුව ඒ 342/216 හි මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී තල්වත්ත ග්‍රාමයේ පිහිටි පට්ටියකැලේ එස්ටේට් යැයි කියනු ලබන ඉඩමට අංක 1135 දරන එකී පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 18 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට ලොට් 15 සහ 16, නැගෙනහිරට ලොට් 17, දකුණට දමයන්ති සහ වෙනත් අය විසින් හිමිකම් කියන ඉඩම සහ බස්නාහිරට ලොට් 19 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහක් (අ. 0, රූඩ්. 0, පර්. 12) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන්ද, වෙනත් අයිතීන්ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග වෙළුම/පත්ඉරුව ඒ 342/217 හි මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතියද සමගය.

එකී තල්වත්ත ග්‍රාමයේ පිහිටි පට්ටියකැලේ එස්ටේට් යැයි කියනු ලබන ඉඩමට අංක 1135 දරන එකී පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 16 (අඩි 15 පිවිසුම) වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට ලොට් 23, නැගෙනහිරට ලොට් 17, දකුණට ලොට් 18 සහ බස්නාහිරට ලොට් 19 සහ 15 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දෙකක් (අක්. 0, රූඩ්. 0, පර්. 2) විශාල ඉඩම් කොටස වෙළුම/පත්ඉරුව ඒ 342/218හි මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත. එකී තල්වත්ත ග්‍රාමයේ පිහිටි පට්ටිකැලේ එස්ටේට් යැයි කියනු ලබන ඉඩමට අංක 1135 දරන එකී පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණයකොට ලොට් 23 (අඩි 20 පිවිසුම) වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට ලොට් 5, 4, 3, 2 සහ 1, නැගෙනහිරට මාර්ග වෙන්කිරීම, දකුණට ලොට් 16, 15, 13, 11, 10, 12, 14, 20 සහ 21 සහ බස්නාහිරට ලොට් 22, 24, 9, 8, සහ 7 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දහයයි දශම පහක් (අක්. 0, රූ. 1, පර්. 10.5) විශාල ඉඩම් කොටස වෙළුම/පත්ඉරුව ඒ 342/206හි මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

01-318

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.